**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

**சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்**

**Department of Samurdhi Development**

සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு
**MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE AND KANDYAN HERITAGE**

**2013** අංක **01** දරණ සමෘද්ධි පනතහි **33(9)** වගන්තිය

ප්‍රකාර සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරන මණ්ඩල අනුමැතිය යටතේ

නිකුත් කරනු ලබන විධානය **:- 2018/03**ට පළමු එකතුව

## "අපේකම රැකගනිමු - ඉතුරුමට මග කියමු"

## සිංහල/ හින්දු අළුත් අවුරුදු උත්සවයට සමගාමීව, ඉතුරුම් ප්‍රවර්ධන හා

## අළුත් අවුරුදු උත්සව වැඩසටහන - 2018

01. සිංහල / හින්දු අලුත් අවුරුදු උත්සවයට සමගාමීව 2018 අප්‍රේල් මස 16 – 25 දින දක්වා කාලය තුළ දියත් කිරීමට යෝජිත ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන සඳහා නිකුත් කර ඇති විධානයන් බැංකු/ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ ඉල්ලීම පහත පරිදි සංශෝධනය කරමි.

02. 2017 අංක 03හි විධාන අංක 03.5 යටතේ තැන්පතු ඉලක්ක සඳහා සමූහ තැන්පත් ගිණුම් ද ඇතුළත් කර ගැනීමට ඉඩදෙනු ලැබේ.

03. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනේදී රැස්කරන තැන්පතු සඳහා තිළිණ ලබා දීම පහත පරිදි තවදුරටත් සංශෝධනය කර ඇත.

03.1 රු.1000 සිට රු.2499 දක්වා මුදල් පරාසය තුල මුදල් තැන්පත් කරන ගිණුම් හිමියන්ට (ළමා ගිණුම් ද ඇතුලත්ව) සඳහා රු.50ක් වටිනා සුදුසු තිළිණයක් දිස්ත්‍රික් ප්‍රසම්පාදන කාර්යයට යටත්ව (සුදුසු ආයතන මඟින්) සිදු කර ලබා දීමට කටයුතු කළ යුතුය.

03.2 සමූහ තැන්පත් ගිණුම් සඳහාද දී ඇති ඇති උපදෙස් පරිදි තිළිණ ලබා දීමට කටයුතු කළ යුතුය. යම් හෙයකින් එක් තිළිණයක් වෙනුවට කණ්ඩායමේ සියලු දෙනාට තිළිණ ඉල්ලා සිටින විටෙක, තැන්පත් කරන මුදලට වැය කළ හැකි උපරිම මිලට සරිලන වෙනත් හඳුන්වා දී ඇති තිළිණ ලබාදිය හැක. නමුත් කිසිඳු අවස්ථාවක ඒකකයකට වැය කළ හැකි උපරිම මිල නොඉක්මවිය යුතුය.

නිදසුන:- රු.15,000 - රු.29,999 අතර මුදලක් තැන්පත් කරන අවස්ථාවක රු.750ක තිළිණයක් හිමිවන අතර, කණ්ඩායමේ තැන්පතු සඳහා එම මුදලටම එක් තිළිණයක් හෝ රු.125/- ක් වටිනා තිළිණ 05ක් ලබාදිය හැකිය. තවද, ලබාදෙන තිළිණය චක්‍රලේඛ උපදෙස් පරිදි සඳහන් තිළිණයක්ම විය යුතුය.




| | අධ්‍යක්ෂ ජනරාල් பணிப்பாளர் தலைமையதிபதி Director General | අධ්‍යක්ෂ (මානව සම්පත්) பணிப்பாளர் (மனிதவளம்) Director (Human Resource) | ප්‍රධාන ගණකාධිකාරී பிரதான கணக்காளர் Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) பணிப்பாளர் (குறு நிதி ) Director ( Micro Finance) | කාර්යාලය அலுவலகம் Office |
|---|---|---|---|---|---|
| el- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| ax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | **Hot Line: 011- 2887722** |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Desktop –SHASHIKA A** |

04. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ, සාමාජික/ දිරියමාතා/ සාමාජික නොවන තැන්පතු ගිණුම් සඳහා රැස්කරන මුදල් සඳහා තිළිණයක් ලබා දී ඇති අවස්ථාවක ස්වශක්ති ණය මුදලක් ඉල්ලුම් කරන විටක, ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ රැස්කරන ලද තැන්පතු වෙනුවෙන් ස්වශක්ති ණය ලබා නොදිය යුතුය.

05. තිළිණ සඳහා කුඩ තෝරා ගැනීමේ දී ඇතුලත් විය යුතු කොන්දේසි.

| කුඩ වර්ගය | විශාලත්වය | රෙදි වර්ගය | රෙදි වර්ගයේ වර්ණය | **සමෘද්ධි බැංකුව** යන්න මුද්‍රණය කිරීම |
|---|---|---|---|---|
| කාන්තා (දෙකට නැමිය හැකි) (Two fold) | මධ්‍යම | Normal Polyester | Golden Yellow & Maroon | Golden Yellow වර්ණය සහිත කොටසෙහි දෙපැත්තෙහි **සමෘද්ධි බැංකුව** යන්න කළු වර්ණය, එක් අකුරක විශාලත්වය සෙ.මී.2.5 |
| ලොකු (පිරිමි) | මධ්‍යම | Normal Polyester | Golden Yellow & Maroon | Golden Yellow වර්ණය සහිත කොටසෙහි හතර පැත්තෙහි **සමෘද්ධි බැංකුව** යන්න කළු වර්ණය හා එක් අකුරක විශාලත්වය සෙ.මී.4.0 |

06. දිස්ත්‍රික් සමෘද්ධි අංශය විසින්, නියමිත පරිදි ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකර, තෝරාගත් ආයතනවලට ඇණවුම් සමඟ පහත තොරතුරු යොමු කළ යුතුය.

01. සමෘද්ධි බැංකුවෙහි නම
02. බැංකු ලිපිනය
03. දුරකතන අංකය
04. අවශ්‍ය කරන තිළිණය හා ප්‍රමාණය

07. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ තිළිණ ලබා දීමට මිල දී ගත් භාණ්ඩ වලින් ඉතිරියක් සිදුවුවහොත් ඉදිරි ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනකට හෝ ගැලපෙන උත්සවයක දී ප්‍රයෝජන ගැනීමට ඉඩදෙනු ලැබේ. නමුත් හැකිතාක් දුරට අවශ්‍ය ප්‍රමාණය නිශ්චිතව පුරෝකථනය කර ලබා ගැනීම වඩාත් සුදුසු වේ.

08. 2018 අප්‍රේල් මස 16 වන දින සමෘද්ධි බැංකුවට පැමිණෙන ගණුදෙනුකරුවන්, පාලක මණ්ඩල සාමාජිකයින් හා නිලධාරීන් සුහදව පිළිගෙන, සංග්‍රහයක් පැවැත්විය යුතුය. ඒ සඳහා බැංකු අරමුදලින් උපරිම රු.5,000/- ක උපරිමයකට යටත්ව සංග්‍රහ වෙනුවෙන් වියදම් දැරීමට ඉඩ දෙනු ලැබේ.

**ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න,**
**සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරන මණ්ඩලයේ සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්**
**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.**